# සංඛ්‍යා රටා ගොඩ නැඟීම




සැකසුම - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## ක්‍රියාකාරකම

**පියවර I**

### දෙමාපියන් සඳහා උපදෙස්

පහත දැක්වෙන ආකාරයේ පින්තූර හා සංඛ්‍යා කාඩ්පත් 6 බැගින් සකස් කරගන්න. එය පහත දැක්වෙන ආකාරයට රටාවකට තැබීමට දරුවා යොමු කරන්න.




තැබූ සංඛ්‍යා 2, 3, 2, 3, 2, 3, 2, 3, 2, 3, 2, 3 යනුවෙන් ශබ්ද නඟා කියවීමට දරුවා යොමු කරන්න. තවදුරටත් ගොඩනැඟීමේදී ඊළඟට ආයුතු සංඛ්‍යාව ප්‍රකාශ කිරීමට දරුවාට අවස්ථාව දෙන්න.

**පියවර II**

ඉහත රූප හා සංඛ්‍යා කාඩ්පත් ඇසුරින් තවත් රටාවක් ගොඩ නැඟීමට දරුවාට මඟ පෙන්වන්න.

උදා:- 

මෙලෙස කස් සංඛ 3 කියව . රටාව 3 ගොඩ නැඟී ඇති අයුරු කියා දෙන්න. මෙම පින්තූර හා සංඛ්‍යා කාඩ් මඟින් තවත් රටා කීපයක් ගොඩ නැඟීමට දරුවා යොමු කරන්න.

## ක්‍රියාකාරකම

| 2 | 4 | 6 | මෙම ඉලක්කම් කාඩ් එකකින් කාඩ් 3 බැගින් කාඩ් පත් 9 ක් සකස් කරගන්න. දෙමාපියන් එක් කාඩ්පතක් තබා ඉදිරියට සංඛ්‍යා රටාවක් ගොඩ නැඟීමට දරුවා යොමු කරන්න. ගොඩ නැඟූ රටා කියවීමට හැම විටම දරුවා යොමු කරන්න.

උදා-

01). 2 4 6 2 4 6

02). 4 2 4 2 4 2

## ක්‍රියාකාරකම

පියවර I

### දෙමාපියන් සඳහා උපදෙස්

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 5 | 7 | 9 | 11 | 13 | 15 | 17 | 19 | 1 කට්ටලය |
| 2 | 4 | 6 | 8 | 10 | 12 | 14 | 16 | 18 | 20 | 2 කට්ටලය |

මෙම සංඛ්‍යාපත් කට්ටල දෙක පාට දෙකකින් සකස් කරගන්න. එම සංඛ්‍යාපත් කාඩ් මිශ්‍රකර පිළිවෙළින් 1 2 3 4 ................ 20 තෙක් දරුවා සමඟ පිළිවෙළට තබන්න. එම සංඛ්‍යා කියවීමට දරුවා යොමු කරන්න. ඉන්පසු එක පාටකින් ලියූ කාඩ්පත් ඉවත් කරන්න. අනෙක් පාටින් ලියූ ඉතිරි වූ කාඩ්වල සංඛ්‍යා කියවීමට දරුවා යොමු කරන්න. එහි රටාවක් ඇති බව කියාදෙන්න. පසුව ඉවත් කළ සංඛ්‍යා කාඩ්පත් වෙනත් පේළියකට සකස් කර කියවීමට යොමු කරවන්න.

- ගණිතය වැඩ පොතෙහි පිටු අංක 95 සහ 104 හි අභ්‍යාස කිරීමට දරුවා යොමු කරන්න.